22140180

International Baccalaureate®
Baccalauréat International
Bachillerato Internacional

**SINHALESE A: LITERATURE – STANDARD LEVEL – PAPER 2**
**SINGHALAIS A : LITTÉRATURE – NIVEAU MOYEN – ÉPREUVE 2**
**SINGALÉS A: LITERATURA – NIVEL MEDIO – PRUEBA 2**

Monday 12 May 2014 (afternoon)
Lundi 12 mai 2014 (après-midi)
Lunes 12 de mayo de 2014 (tarde)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Answer one essay question only. You must base your answer on at least two of the Part 3 works you have studied and compare and contrast these works in response to the question. Answers which are not based on a discussion of at least two Part 3 works will not score high marks.
- You are not permitted to bring copies of the works you have studied into the examination room.
- The maximum mark for this examination paper is *[25 marks]*.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Traitez un seul sujet de composition. En basant votre réponse sur au moins deux des œuvres de la troisième partie que vous avez étudiées, vous devez comparer et opposer ces œuvres dans le cadre du sujet. Les réponses qui ne sont pas basées sur au moins deux des œuvres de la troisième partie n'obtiendront pas une note élevée.
- Vous n'êtes pas autorisé(e) à apporter des exemplaires des œuvres que vous avez étudiées dans la salle d'examen.
- Le nombre maximum de points pour cette épreuve d'examen est *[25 points]*.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Conteste una sola pregunta de redacción. Base su respuesta en al menos dos de las obras estudiadas de la Parte 3, comparándolas y contrastándolas en relación con la pregunta. Las respuestas que no se basen en al menos dos obras de la Parte 3 no recibirán una puntuación alta.
- No está permitido traer copias de las obras estudiadas a la sala de examen.
- La puntuación máxima para esta prueba de examen es *[25 puntos]*.


© International Baccalaureate Organization 2014

https://xtremepape.rs/

**පහත සඳහන් ප්‍රශ්න අතුරින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න. 3 වන කොටසේදී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් යටත් පිරිසෙයින් දෙකක් වත් ඔබේ පිළිතුරට පදනම් විය යුතු වන අතර ප්‍රශ්නයට අදාළ වන සේ එම කෘති සන්සන්දනාත්මකව විමර්ශනය කළ යුතුය. 3 වන කොටසෙන් යටත් පිරිසෙයින් ග්‍රන්ථ දෙකක් පිළිබඳ සාකච්ඡාවක් පදනම් කොටගෙන නොමැති පිළිතුරුවලට ඉහළ ලකුණු ගණනක් නොලැබෙනු ඇත.**

**සම්භාව්‍ය සාහිත්‍යය**

**1.** සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ සදාචාරාත්මක හා ආගමික මුහුණුවර නිරූපණය කර ඇති ආකාරය සහ එහි ප්‍රතිඵලය ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරෙන් සන්සන්දනාත්මකව විමසන්න.

**2.** සම්භාව්‍ය සිංහල සාහිත්‍යය මගින් කල්පිතය ඉදිරිපත් කර ඇති විලාසය පිලිබඳව, ඔබ හැදෑරූ කෘති දෙකක් ඇසුරු කරගනිමින් විමර්ශනය කරන්න.

**3.** සම්භාව්‍ය සිංහල සාහිත්‍යය සඳහා යොදාගෙන ඇති වාග් ව්‍යවහාරය පෞරාණික වුවද, අපේක්ෂිත පණිවුඩය පාඨකයා වෙතට ප්‍රබලව ඉදිරිපත් කිරීමට හැකි වීම අතින් බෙහෙවින් සාර්ථකය. ඔබ අධ්‍යයනය කළ කෘති දෙකක් පාදක කරගනිමින් මෙම කියමනට පක්ෂව හෝ විපක්ෂව කරුණු ඉදිරිපත් කරන්න.

**නාට්‍යය**

**4.** නාට්‍ය කරුවන් තම නිර්මාණ සඳහා සන්දර්භය යොදාගෙන ඇති ආකාරය හා එහි ප්‍රබල බව ඔබ හදාරා ඇති කෘතීන් දෙකක් පාදක කරගනිමින් සන්සන්දනය කර දක්වන්න.

**5.** ඔබ හැදෑරූ නාට්‍ය කෘති දෙකක් ඇසුරෙන්, නාට්‍ය රචකයන් ඒවායේ නාට්‍යමය උත්ප්‍රාසය යොදාගෙන ඇති අයුරු සන්සන්දනය කරමින් විග්‍රහ කරන්න.

**6.** සිංහල ශෛලිගත නාට්‍යයෙහි උපමා අලංකාර සහිත භාෂාව යොදාගෙන ඇති ආකාරය ඔබ හදාරා ඇති කෘති දෙකක් උපයෝගී කරගනිමින් විභාග කරන්න.

**නවකථාව**

**7.** යථාර්ථවාදය, නවකථා ක්ෂෙත්‍රය තුළ වෙසෙසින්ම අන්තර්ගත වූවකි. යථාර්ථවාදය පිලිබඳ මූලික ලක්ෂණ මොනවාද? මේ ගැන හඳුන්වා දෙමින් ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

**8.** ගැමි පසුබිමක පිහිටා ලියවෙන නවකතා බොහෝ සිංහල පාඨකයන්ගේ සිත් ඇදගනියි. ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරු කරගෙන, ඒවාට පසුබිම් වී ඇති ගම්බද පරිසරය නිරූපණය කොට ඇති ආකාරය සහ එහි ප්‍රතිඵල සන්සන්දනාත්මකව විමසන්න.

**9.** සිංහල නවකතාවල සදාචාරය ඉදිරිපත් කර ඇති ආකාරය සහ එහි බලපෑම පිලිබඳව ඔබ හැදෑරූ කෘති දෙකක් මගින් විභාග කරන්න.



https://xtremepape.rs/

**නූතන පද්‍ය**

**10.** සඳැස් කවි සහ/හෝ නිසඳැස් කවි නිර්මාණය හා ඒවායේ ප්‍රතිඵල පිළිබඳව, ඔබ හදාරා ඇති නිර්මාණ දෙකක් ඇසුරින් සන්සන්දනාත්මක විවරණයක් කරන්න. පාඨක හදවත් තුළ අනුවේදනය දැනවීම සඳහා ඒවා කොතරම් දුරට සාර්ථක වී ඇද්ද?

**11.** චිත්ත සන්තානය තුළ මතු වන කරුණාව පළ කිරීම සඳහා කවිය අගනා මාධ්‍යයකි. ඔබ අධ්‍යයනය කළ නිර්මාණ දෙකක් ඇසුරින් අදහස් දක්වන්න.

**12.** ඇතැම් විට කවියා තම චිත්ත සන්තාපය ප්‍රකට කිරීම සඳහා කවිය උපයෝගී කරගනියි. ඔබ හදාරා ඇති නිර්මාණ දෙකක් සම්බන්ධයෙන් එම තත්වය පිලිබිඹු වන ආකාරය සන්සන්දනය කරන්න.

**කෙටිකතාව**

**13.** ලේඛකයකු තම නිර්මාණ සඳහා යොදාගන්නා අලංකාරෝක්ති එහි අර්ථය පෝෂණය කරයි. ඔබ හදාරා ඇති කෘති දෙකක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

**14.** සිංහල කෙටිකතා අතර, බොහෝ විට දක්නට ලැබෙන්නේ සාමාන්‍ය යථාර්ථය පසුබිම් කරගෙන ලියවුණ කෘති වුවද, ඒවා මගින් විශේෂත්වයකින් යුත් කතා පුවත් ඉස්මතු වෙයි. ඔබ අධ්‍යයනය කළ කෘතීන් දෙකක පසුබිම හා කතා තේමාව සන්සන්දනය කරමින් මෙම කියමන සනාථ කළ හැකිදැයි විමසා බලන්න.

**15.** පාඨකයාගේ අඛණ්ඩ අවධානය යොමු කරගැනීම සඳහා කෙටිකතාවක චරිත සුපරීක්ෂාකාරීව තෝරාගැනීමට කෙටිකතා කරුවෙක් වගබලාගත යුතු වෙයි. ඔබ හදාරා ඇති කෘති දෙකක් මගින් සාකච්ඡා කරන්න.

---



https://xtremepape.rs/